# කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
# දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## සවිස්තරාත්මක අධ්‍යයන වාර්තා ලබාගැනීම හා උපාධි ප්‍රදානෝත්සවය සඳහා අයදුම් කිරීම

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය, ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධිය හා විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධි පරීක්ෂණයන්ට අදාළව 2024 ජනවාරි මස 24 දින නිකුත් කරන ලද උපාධිලාභී නාමලේඛනයන් හි නම් සඳහන් උපාධිලාභීන් හට සවිස්තරාත්මක අධ්‍යයන වාර්තාව (Academic Record) කැලණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ අනුමැතියෙන් පසු 2024 ජනවාරි මස 29 දින සිට ලබාගත හැක.

ඒ සඳහා දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ වෙබ් අඩවියට පිවිස බාගත කරගත් අයදුම්පත නිසි ලෙස සම්පූර්ණ කර නියමිත මුදල් ගෙවීමෙන් අනතුරුව පහත දැක්වෙන **<u>එක් ක්‍රමයක්</u>** මගින් ලබාගැනීමට හැකියාව පවතී.

01. දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය වෙත අයදුම්පත හා මුදල් ගෙවන ලද වවුචර්පත මධ්‍යහ්න 12.00 ට පෙර ගෙනැවිත් බාරදීමෙන් එදිනම ලබාගත හැක.

02. අයදුම්පත හා මුදල් ගෙවන ලද වවුචර්පත **"ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය, තැ.පෙ. 03, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය."** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමුකිරීමෙන් පසු තම පෞද්ගලික ලිපිනයට ගෙන්වා ගත හැක.

එසේම ඉහත උපාධි පරීක්ෂණයන්ට අදාළ උපාධිලාභීන් සඳහා නියමිත උපාධි ප්‍රදානෝත්සව අයදුම්පත් **2024.01.29** දින සිට අප වෙබ් අඩවියෙන් **(www.cdce.kln.ac.lk)** බාගත කර ගැනීමේ හැකියාව පවතින අතර එසේ බාගත කරගත් අයදුම්පත් **2024.02.15** දිනට පෙර නියමිත පරිදි සම්පූර්ණ කර ඉහත දක්වා ඇති ලිපිනයට තැපැල් කළ යුතුය.

තවද මෙතෙක් නිකුත් කරන ලද උපාධි නාමලේඛනයන් හි නම් සඳහන් එහෙත් උපාධි ප්‍රදානෝත්සවය සඳහා අයදුම් කිරීමට නොහැකි වූ උපාධිලාභීන්ට ද මෙම කාලසීමාව තුළ ඒ සඳහා අයදුම් කළ හැක.

මෙම සියලුම උපාධිලාභීන්ට අදාළ උපාධි ප්‍රදානෝත්සවය 2024 මැයි මස පැවැත්වීමට නියමිත බව වැඩිදුරටත් දන්වමි.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,
දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය,
කැලණිය විශ්වවිද්‍යාලය,
කැලණිය.
2024.01.24